Good Food, Good Life



# නව UHT කිරි නිෂ්පාදනාගාරය අරඹමින් නෙස්ලේ ශ්‍රී ලංකාව තුළ ආයෝජනයේ තවත් සන්ධිස්ථානයක් සනිටුහන් කරයි

ලොව ප්‍රමුඛතම පෝෂණ, සෞඛ්‍ය හා සුවතා සමාගම වන නෙස්ලේ ඊයේ කුරුණෑගල පිහිටි අති නවීන තාක්ෂණයෙන් යුත් කම්හල් සංකීර්ණයේදී ඉදිරි වසර කීපය තුළ ශ්‍රී ලංකාව සඳහා කරනු ලබන බිලියන 10ක ආයෝජනයක තෙවැනි පියවර සනිටුහන් කරමින් නව UHT කිරි නිෂ්පාදනාගාරයක් විවෘත කළේය.

නව නිෂ්පාදනාගාරය නෙස්ලේහි දැනට පවතින සැකසුම් පහසුකම් තව දුරටත් ව්‍යාප්ත කිරීමක් වන අතර 2011 වසරේ ආරම්භ කළ මෝල්ටීය පාන නිෂ්පාදනාගාරය සහ 2012 වසරේ ආරම්භ කළ නූඩ්ල්ස් නිෂ්පාදනාගාරය සමගින් මේ වන විට ශ්‍රී ලංකාව සඳහා සිදු කිරීමට නියමිත රුපියල් බිලියන 10ක සමස්ත ආයෝජනයෙන් රුපියල් බිලියන 3ක ප්‍රමාණයක් ආයෝජනය කොට තිබේ. නෙස්ලේහි නව UHT කිරි නිෂ්පාදනාගාරය මගින් සමාගමේ කිරි වලින් නිෂ්පාදනය කෙරෙන ජනප්‍රියම බීම වර්ගවල ධාරිතාව තවදුරටත් ඉහළ නැංවෙනු ඇත.

නෙස්ලේ ශ්‍රී ලංකාවේ පුද්ගලික අංශයේ විශාලතම කිරි එක්රැස් කරන සමාගම වන අතර දිනකට දිවයින පුරා කිරි ගොවීන් 15,000ක ගෙන් පමණ කිරි එක්රැස් කරගනී. වසර 2009දී නෙස්ලේ සමාගම වසර කීපයක යුද්ධයේ අහිතකර බලපෑම් වලින් පීඩාවට පත්ව තිබූ රටේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ප්‍රබල කිරි නිපැයුම් සංවර්ධන මෙහෙයුමක් දියත් කළේය. එම ප්‍රදේශවල කිරි ගොවීන් සඳහා ලබාදුන් සැලකිය යුතු තරමේ පුහුණුව හා සංවර්ධන මූලාරම්භයන්ට අමතරව නෙස්ලේ සමාගම විසින් දේශීය කිරි නිෂ්පාදනයේ සංවර්ධනයක් ඇති කිරීමට සහ ශ්‍රී ලංකාව කිරි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත කිරීම සඳහා සහාය වීමට ක්‍රියාකාරී ලෙස දායක වෙමින් කිරි ගොවින්ට තම කිරි ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ පහසුව සඳහා රට පුරා කිරි එකතු කිරීම් හා ශීත කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවන ලදි.

"ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා නෙස්ලේ දක්වන ශක්තිමත් හා අඛණ්ඩ කැපවීම පිළිබඳව මා සතුටු වෙනවා. අද දින විවෘත කළ මේ නව UHT කිරි නිෂ්පාදනාගාරයෙන් ජනතාව සඳහා විශාල රැකියා අවස්ථාවන් මෙන්ම ස්ථිර ආදායම් මාර්ගද සැපයෙන අතර ශ්‍රී ලංකාවේ සුබවාදී ඉදිරිය පිළිබඳව අප දක්වන සැලකිල්ලද මෙමගින් තහවුරු වෙනවා. නෙස්ලේ ලොව ප්‍රමුඛතම ගෝලීය සමාගමක් වුණත් අපේ ප්‍රමුඛත්වය හිමි වන්නේ අප සම්බන්ධව වී කටයුතු කරන දේශීය ප්‍රජාවේම පූර්ණ කොටසක් ලෙස පැවැතීමටයි. ශ්‍රී ලංකාවේ වෙසෙන එවැනි බොහෝ උදනා මෙන් අපද මෙහි වසර 100කට අධික කාලයක් රැඳී සිටිනවා. නෙස්ලේ සමාගම ශ්‍රී ලංකාව තුළ ගැඹුරටම මුල් ඇදපු සමාගමක් වන අතර මෙරට පොදු වර්ධනයට හා සංවර්ධනයට සහාය වීමට කැපවීමෙන් කටයුතු කරනු ලබනවා." මේ පිළිබඳව තම අදහස් දක්වමින්

නෙස්ලේ දකුණු ආසියානු විධායක උප සභාපති සහ ආසියා, ඕෂනියා, අප්‍රිකාව හා මැද පෙරදිග යන කලාප වල අධ්‍යක්ෂ නන්දු නන්ද්කිෂෝර් මහතා සඳහන් කළේය.

නෙස්ලේ හි නව UHT කිරි නිෂ්පාදනාගාරය එම උත්සව අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිතයා ලෙස පැමිණි ආර්ථික සංවර්ධන ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා අතින් විවෘත කෙරිණ. මෙම අවස්ථාවට විශේෂ ආරාධිතයින් ලෙස වාණිජ සහ කර්මාන්ත අමාත්‍ය රිෂාඩ් බදුර්දීන් පාරිසරික ගරු අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා වයඹ පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය අතුල විජේසිංහ සහ ශ්‍රී ලංකාවේ ස්විට්සර්ලන්ත ගරු තානාපති තෝමස් ලිට්ෂර් යන මහත්වරුන්ද සහභාගි වූහ.

මේ පිළිබඳව තම අදහස් දැක්වූ නෙස්ලේ ලංකා PLC හි කළමනාකාර අධ්‍යක්ෂ ඇලෝයි හොෆ්බාර් මහතා මෙසේ පැවැසීය. "කුරුණෑගල පිහිටි අපේ අති නවීන තාක්ෂණයෙන් යුත් නිෂ්පාදන සංකීර්ණයේ මේ වන විට නිපදවන අපේ නිපැයුම් වලින් 90%ක්ම දේශීය වශයෙන් අලෙවි කරනු ලබනවා. මයිලෝ, නෙස්ටොමෝල්ට්, නෙස්ප්‍රේ සහ මිල්ක්මේඩ් වැනි කිරි වලින් නිෂ්පාදනය කරන අපේ පාන වර්ග ශ්‍රී ලංකාවේ නිවෙස්වල විශාල ජනප්‍රියත්වයක් ලබා තිබෙන අතර දේශීය වශයෙන් කිරි එක්රැස් කිරීම හා නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම තුළින් තව තවත් නව ආකර්ෂණීය නිපැයුම් වලින් පාරිභෝගිකයින් සතුටු කරන්නද අපට හැකියාව ලැබේවි.
මෙරට බොහෝ සැපයුම්කරුවන්ට සහ කිරි ගොවීන්ට ධනාත්මක ලෙස බලපෑම් ඇති කිරීමට අපට උපකාරි කිරීම තුළින් මෙම නවතම ආයෝජනය දේශීය ප්‍රජාවට ප්‍රතිපල රැසක් අත් කර දෙනවා.

- Ends -

**වැඩිදුර තොරතුරු සඳහා විමසීම් –**



| | |
|---|---|
| සමන්තා මෙන්ඩිස්<br>ආයතනික සන්නිවේදන කළමනාකාර<br>නෙස්ලේ ලංකා PLC<br>තැ. පෙ. 189 කොළඹ / 440, ටී. බී. ජායා මාවත,<br>කොළඹ 10.<br>දුරකථනය<br>ජංගම : 077 3405154 \| සෘජු : 4794597<br>පොදු : 2 699 991 / 2 696 304, දිගුව: 524 \|<br>**ෆැක්ස්** : 5330044<br>samantha.mendis@lk.nestle.com | දමිත කුලතුංග<br>ආයතනික පොදු කටයුතු කළමනාකාර<br>නෙස්ලේ ලංකා PLC<br>තැ. පෙ. 189 කොළඹ / 440, ටී. බී. ජායා මාවත,<br>කොළඹ 10.<br>දුරකථනය<br>ජංගම: 077915949 \| සෘජු : 4794597<br>පොදු: 2 699 991 / 2 696 304, දිගුව: 540 \|<br>**ෆැක්ස්**: 5330044<br>damitha.kulatunga@lk.nestle.com |